දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

# භූවිප්‍ර 1.1 - මානව භූගෝලවිද්‍යාව
# GY 1.1 – Human Geography

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

(01) "මානව භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රයේ පදනම වනුයේ මිනිසා සහ පරිසරය අතර පවත්නා සම්බන්ධතාවය විග්‍රහ කිරීමයි." මානව භූගෝල විද්‍යා විෂය කරුණු සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රකාශය විමසන්න.

(ලකුණු 20 යි)

(02) (i) ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්ති ආදර්ශකය (Demographic Transition Model) ප්‍රස්තාරිකව ගෙන හැර දක්වා පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ප්‍රවනතාවන් උචිත දත්ත ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 12 යි)

(03) (i) සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල කාර්මීකරණ ක්‍රියාවලිය තුළින් පැන නැගී ඇති ප්‍රධාන ගැටළු නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

(ii) නව කාර්මීකරණ රටවල (NIC) වේගවත් ආර්ථික ප්‍රගතියට බලපෑ හේතු සාධක මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(04) සියුම් පාරිභෝගික කෘෂිකර්මය, මධ්‍යධරණී කෘෂිකර්මය හා මිශ්‍ර ගොවිතැන පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්,

1. ඉහත කෘෂිකර්මාන්ත පැතිරී ගිය ප්‍රදේශ
2. එම කෘෂිකර්මාන්තයන්හි නිෂ්පාදන කටයුතු සිදුවන ආකාරය
3. එම කෘෂිකර්මාන්තයන්හි නූතන ප්‍රවනතා

පැහැදිලිව පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

(05) (i) "නාගරික ප්‍රදේශය" (urban area) "නගරීකරණය" (urbanization) සහ "දැවැන්ත නගර" (mega cities) යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ලකුණු 06 යි)

(ii) "ලෝක නගරීකරණ ක්‍රියාවලිය තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල් ආශ්‍රිතව සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කරයි" උචිත දත්ත හා නිදසුන් යොදා ගනිමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 14 යි)

(06) (i) ගෝලීයකරණය (Globalization) යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ලකුණු 05 යි)

(ii) සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජාත්‍යන්තර වෙළඳ කටයුතු කෙරෙහි ගෝලීයරකණයේ බලපෑම කෙබඳුදැයි උචිත නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(07) (i) රටක සංවර්ධනය මැනීමේ දී භාවිතා කරන දර්ශක 3 ක් අර්ථාන්විතව පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(ii) ඔබ සඳහන් කළ එක් දර්ශකයක් ඇසුරෙන් ගෝලීය සංවර්ධනයෙහි ක්ෂේත්‍රීය විෂමතාවන් පිළිබිඹු කළහැකි ආකාරය නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 14 යි)

(08) පහත සඳහන් මාතෘකා <u>දෙකක්</u> ඇසුරින් කෙටි සටහන් සපයන්න.

(i) මානව වර්ග හඳුනා ගැනීමේ නිර්නායක

(ii) චිරස්ථායී සංවර්ධන සංකල්පය

(iii) මානව පරිනාමය සිදු වූ ආකාරය

(iv) ව්‍යාපාරික කිරිපට්ටි පාලනය සිදු කරන ප්‍රදේශ සහ ඒ ආශ්‍රිත ප්‍රවනතා

(ලකුණු 10x2 = 20 යි)

******************************************